අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. : ED/09/02/01/03/009

ඔබේ යොමුව / உமது இல. / Your Ref. :

දිනය / திகதி / Date : 2026.07.23

චක්‍රලේඛ අංකය - 29/2026

කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පීඨාධිපතිවරුන්, ගුරු විද්‍යාලවල විදුහල්පතිවරුන්,
සියලු ම පාසල්වල විදුහල්පතිවරුන් වෙත,

**<u>"සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" ජාතික වැඩසටහන අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ක්‍රියාවට නැංවීම</u>**

ශ්‍රී ලංකාවේ සමස්ත රාජ්‍ය සේවයේ ම ගුණාත්මකභාවය හා පාරදෘශ්‍යභාවය ඉහළ නැංවීමේ අරමුණින් Clean Sri Lanka ව්‍යාපෘතිය යටතේ, සුපිළිපන් රාජ්‍ය සේවයක් සඳහා වන "සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" ජාතික වැඩසටහනට සමගාමී ව, එළඹෙන 2026 ජූලි 27 දින සිට ජූලි 31 දින දක්වා ජාතික සුපිළිපන් සතිය ප්‍රකාශයට පත් කර ඇත.

ඒ අනුව පහත දැක්වෙන උපදෙස් පරිදි සියලු ම ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතු බව කාරුණික ව දන්වමි.

**01. පාසල් හැර මෙම අමාත්‍යාංශයට අයත් සියලු ම ආයතන**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ඇතුළු අමාත්‍යාංශය යටතේ පවතින අනෙකුත් සියලු ම ආයතන සහ කාර්යාල පහත දැක්වෙන ක්‍රියාකාරකම් සැලැස්මට අනුව කටයුතු කළ යුතු ය.

1.1 සුපිළිපන් ප්‍රතිඥාව ලබා දීම:

ජාතික සුපිළිපන් සතියේ ආරම්භක දිනය යෙදෙන 2026 ජූලි 27 දින පෙරවරු 09.00ට සියලු ම ආයතනවල කාර්ය මණ්ඩලය ආයතනික මට්ටමින් එක්රැස් වී මෙම චක්‍රලේඛයේ ඇමුණුම් අංක 01හි දැක්වෙන ජාතික සුපිළිපන් දිවුරුම / ප්‍රතිඥාව කියවිය යුතු ය.

1.2 ආයතනික සැලසුම් සකස් කිරීම:

සෑම ආයතනයක් ම සිය කාර්ය මණ්ඩලයේ අදහස් ද ලබා ගනිමින් ආයතනික සුපිළිපන්නභාවය තහවුරු කෙරෙන කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු ය. විශේෂයෙන් කෙටිකාලීන ක්‍රියාකාරකම් යටතේ පාරදෘශ්‍යභාවය, වගවීම, පරිපාලන බාධා අවම කිරීම, සමානාත්මතාවය, මූල්‍ය විනය සහ ප්‍රසම්පාදන විනිවිදභාවය යන කරුණුවලට ප්‍රමුඛතාව දෙමින් වැඩසටහන් හඳුනාගෙන ජූලි 27 දින සිට දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කළ යුතු ය.

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister : +94112784832 | +94112784825 | minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary : +94112784811 | +94112785162 | secretary.education@moe.gov.lk | moesecretaryoffice@gmail.com

CamScanner

1.3 ක්ලීන් ශ්‍රී ලංකා පරමාදර්ශ 10 හා බැනරය ප්‍රදර්ශනය කිරීම:

ජාතික සුපිළිපන් සතියට සමගාමී ව 2026 ජූලි 27 දින සිට සෑම ආයතනයක ම කාර්ය මණ්ඩලයේ සහ සේවාලාභීන්ගේ නෙත ගැටෙන පරිදි, මෙම චක්‍රලේඛයේ ඇමුණුම් අංක 02හි දැක්වෙන "ක්ලීන් ශ්‍රී ලංකා පරමාදර්ශ 10" සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ම ප්‍රදර්ශනය කළ යුතු ය. මීට අමතර ව ඇමුණුම් අංක 02 යටතේ ලබා දී ඇති ආකෘතියට අනුව අඩි 6x4 ප්‍රමාණයේ බැනරයක් ද ආයතන පරිශ්‍රයේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ යුතු ය.

1.4 සුපිළිපන්නභාවය ප්‍රවර්ධනය සඳහා වන අතිරේක වැඩසටහන්:

ඉහත මූලික ක්‍රියාකාරකම්වලට අමතර ව, ආයතනය තුළ සුපිළිපන්න සංස්කෘතියක් ගොඩනැගීම සඳහා ආයතන මට්ටමින් පිළියෙල කරන කෙටි කාලීන සැලැස්ම යටතේ සුපිළිපන්නභාවය පිළිබඳ සම්මන්ත්‍රණ, දැනුම්වත් කිරීමේ වැඩමුළු සහ වෙනත් යෝග්‍ය ප්‍රායෝගික වැඩපිළිවෙළ සංවිධානය කර ක්‍රියාත්මක කිරීම යෝග්‍ය වේ.

**02. පාසල් සඳහා විශේෂ උපදෙස්**

මේ දිනවල දිවයින පුරා පාසල් සහ පිරිවෙන්වල ක්‍රියාත්මක වන වාර විභාග කටයුතු සැලකිල්ලට ගනිමින් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට බාධාවක් නොවන පරිදි, පාසල් වල මෙම ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම **2026 අගෝස්තු 03** දින සිට පහත පරිදි සිදු කළ යුතු ය.

2.1 සුපිළිපන් ප්‍රතිඥාව ලබා දීම:

2026 අගෝස්තු 03 දින සෑම පාසලක ම පෙරවරු 7.30ට කෙටි කාර්ය මණ්ඩල රැස්වීමක් පවත්වා මෙම චක්‍රලේඛයේ ඇමුණුම් අංක 01 හි දැක්වෙන "සුපිළිපන් දිවුරුම / ප්‍රතිඥාව" ලබා දීමට කටයුතු කළ යුතු ය.

2.2 පාසල් සුපිළිපන්න සමාජය පිහිටුවීම:

මෙම අමාත්‍යාංශය විසින් නිකුත් කළ අංක 26/2016 චක්‍රලේඛය මගින් ලබා දී ඇති උපදෙස් පරිදි මේ වන විටත් පාසල්වල සුපිළිපන්න සමාජ (School Integrity Clubs) පිහිටුවා ක්‍රියාත්මක විය යුතු ව ඇත. එම සමාජ මෙතෙක් පිහිටුවා නොමැති සියලු ම පාසල්, වහා ම ක්‍රියාත්මක වන පරිදි පාසල් සුපිළිපන්න සමාජ පිහිටුවීමට සහ සක්‍රීයව පවත්වා ගැනීමට පියවර ගත යුතු ය.

2.3 පාසල් මට්ටමේ සැලසුම් සකස් කිරීම:

පාසල්වල ස්ථිරසාර සුපිළිපන්න සංස්කෘතියක් ඇති කිරීම සඳහා 2026 දෙසැම්බර් 31 දක්වා වන සුපිළිපන්නභාවය පිළිබඳ කෙටිකාලීන සැලැස්ම ද, ඊට සමගාමී ව මධ්‍යකාලීන හා දීර්ඝකාලීන සැලසුම් ද කඩිනමින් පිළියෙළ කළ යුතුය. මෙම සැලසුම් සකස් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී පාසල් සුපිළිපන්න සමාජයේ දායකත්වය ලබා ගත යුතු ය.



CamScanner

2.4 'සුපිළිපන් සිතුවිලි' නිර්මාණ පුවරුව:

සෑම පාසලක ම සිසුන් සහ කාර්ය මණ්ඩලය තුළ සුපිළිපන් මනෝභාවය තහවුරු කිරීම සහ ඒ පිළිබඳ යහපත් ආකල්ප ප්‍රවර්ධනය සඳහා "සුපිළිපන් සිතුවිලි" නමින් විශේෂ නිර්මාණ පුවරුවක් පාසල් පරිශ්‍රයේ ස්ථාපිත කළ යුතු අතර ඒ සඳහා සිසුන් විසින් ඉදිරිපත් කරනු ලබන චිත්‍ර, නිසඳැස්, රචනා ආදී නිර්මාණ පාසල් සුපිළිපන්න සමාජයේ මෙහෙයවීම යටතේ පාසල් මට්ටමින් මාසික ව ඇගයීමට ලක් කිරීමට පියවර ගත යුතු ය. සුපිළිපන්න භාවය පිළිබඳ දියුණු ආයතනික සංස්කෘතියක් තහවුරු කිරීම සඳහා වන අඛණ්ඩ මැදිහත්වීම හා සිහිගැන්වීම තහවුරු කිරීම සඳහා මෙම නිර්මාණ පුවරුව පාසල් සුපිළිපන්න සමාජයේ මෙහෙයවීම යටතේ යාවත්කාලීන ව පවත්වා ගැනීම අත්‍යවශ්‍ය ය.

"සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" ජාතික මෙහෙයුමෙහි අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා ඉහත උපදෙස් පරිදි කටයුතු කිරීම අනිවාර්ය බව මෙයින් දන්වමි.

නාලක කලුවැව
ලේකම්

පිටපත්:

1. සියලු ම පළාත් ආණ්ඩුකාරවරුන්
2. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය
3. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
4. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
5. සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරු
6. සියලු ම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරුන්
7. විගණකාධිපති
8. අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව



CamScanner

ඇමුණුම 01

**සුපිළිපන් දිවුරුම / ප්‍රතිඥාව - 2026**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ
ගෞරවණීය රාජ්‍ය සේවකයෙකු වන මම,
රාජකාරියේ දී, සමස්ත රාජ්‍ය සේවයේ ප්‍රගමනය වෙනුවෙන්
මා තුළ වන අඩුපාඩු හා දුර්වලතා හඳුනාගෙන
ආදර්ශයෙන් වෙනස් වීමටත්,
ඒ අනුව මා අවට රාජකාරි පරිසරය හා සමාජයේ
සුපිළිපන් වෙනසක් සිදු කිරීමටත්
පෞද්ගලික ලාභ ප්‍රයෝජනවලට වඩා
සෑම විට ම පොදු මහජන යහපතට ප්‍රමුඛතාවය දෙන බවටත්,
කිසිදු බාහිර අධීක්ෂණයකින් තොරව වුව ද,
මාගේ හෘද සාක්ෂියට එකඟ ව ස්වයං - පාලනයකින් යුතු ව,
සැමවිට ම නිවැරදි සහ සදාචාරාත්මක දේ පමණක් සිදු කරන බවටත්,
රාජ්‍ය සේවයේ පදනම වන පාරදෘශ්‍ය භාවය, වගවීම,
මූල්‍ය විනය සහ නීතියට ගරු කිරීම යන වටිනාකම්
මාගේ දෛනික රාජකාරිවල දී අනුගමනය කරන බවටත්,
රාජ්‍ය පරිපාලන පද්ධතියෙන් අල්ලස, දූෂණය, නාස්තිය,
ළඟැදියාවන් අතර ගැටුම, ඥාති සංග්‍රහය සහ අකාර්යක්ෂමතාවය
සහමුලින්ම තුරන් කිරීම වෙනුවෙන් කැපවන බවටත්,
මා වෙත පැමිණෙන සෑම සේවාලාභියෙකුට ම
කිසිදු භේදයකින් තොර ව, සමානාත්මතාවයෙන් සහ
කාරුණිකව සේවය සැපයීමට මා බැඳී සිටින බවටත්,
"සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" උදෙසා වන
මෙම ජාතික මෙහෙයුමට මාගේ උපරිම දායකත්වය ලබා දෙන බවටත්
මෙයින් ප්‍රතිඥා /දිවිරුම් දෙමි!



CamScanner

ඇමුණුම 02

ක්ලීන් ශ්‍රී ලංකා පරමාර්දර්ශ 10 සහ "සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" ජාතික මෙහෙයුමේ බැනරය

ජාතික සුපිළිපන් සතියට සමගාමී ව ප්‍රදර්ශනය කළ යුතු පරමාදර්ශ 10 සහ බැනරයට අදාළ නිර්මාණ ආකෘතිය (Design) පහත සබැඳිය මගින් බාගත කර ගත හැක.

Link -

https://drive.google.com/drive/folders/1fvGL2tpBUlvUp722FekRk_NxGYhWqSE6?usp=sharing

QR

CamScanner